සබරගමුවපළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **07 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2018** **தரம் 07**
**FirstTerm Test 2018** **Grade 07**

**බුද්ධ ධර්මය I,II** ***කාලය පැය දෙකයි.***

නම ....................................................................................................................

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඇසුරු කරමින් සති හතක් ගත කළ බුදුන් වහන්සේ පස්වන සතිය වැඩ සිටියේ
   1.මිදෙල්ල ගස මුලය .
   2.අජපාල නුග රුක මුලය.
   3.රාජායතන කිරිපලු නුග රුක මුලය.
   (.............)
2. බුදුරජාණන් වහන්සේට අත්සුනු හා මී පිඩු පූජා කරන ලද්දේ,
   1. තපස්සු,භල්ලුක දෙදෙනාය.
   2. සොත්ථිය බමුණාය
   3. සහම්පතී මහා බ්‍රහ්මයා
3. බුදු සසුනේ පළමු ආරාම පූජාව වන්නේ,
   1.වේළුවනාරාමයයි.
   2.ජේතවනාරාමයයි.
   3.පූර්වාරාමයයි. (.............)
4. නව අරහාදී බුදු ගුණ සඳහන් කරමින් රචනා කර ඇති කාව්‍ය ග්‍රන්ථය වන්නේ.
   1.කාව්‍යශේඛරය
   2.ලෝවැඩ සඟරාව
   3. බුදුගුණඅලංකාරය (.............)
5. මිගාර මාතා නමින් ප්‍රසිද්ධ වූයේ ,
   1.පටාචාරාවයි.
   2.විශාඛාවයි.
   3.ප්‍රජාපතී ගෝතමියයි. (.............)

➢ පහත සඳහන් වාක්‍ය හොඳින් කියවා නිවැරදි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( x ) ලකුණ ද යොදන්න.

6. බුදුරජාණන් වහන්සේ බිම්බිසාර රජුට තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනා කළ සේක. (.............)
7. මෙත් වඩන්නෙකු ළඟ තිබිය යුතු උසස් ගුණාංග 15 ක් කරණීයමෙත්ත සූත්‍රයේ අඩංගු වේ. (.............)
8. සිරිත් මල් දම කෘතිය රචනා කරන ලද්දේ වීදාගම මෛත්‍රී හිමියන් විසිනි. (.............)

9. ඉඳුල් ආහාර තැන තැන නොදැමීම යහපත් ශිෂ්‍යයකුගේ ලක්ෂණයකි. (............)

10.බුද්ධ ශරීරයෙන් බුදුරැස් විහිදෙන්නට පටන් ගත්තේ සිව්වන සතියේය. (............)

➢ පහත සඳහන් ප්‍රශ්න හොඳින් කියවා ගැලපෙන නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

11. බරණැස ඉසිපතනය කරා වැඩම කරන බුදුරජාණන් වහන්සේට අතරමගදී.......................................හමු විය.

12. බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකා ගමනය සිදු වූයේ ..........................පොහෝ දිනකදීය.

13. බුදු සසුනේ අග්‍ර දායකයා වූයේ ,.......................... සිටු තුමාය.

14. විසි දහසක් රහතන් වහන්සේලා සමඟ බුදුරජාණන් වහන්සේ ..........................පොහෝ දින කිඹුල්වත් පුරයට වැඩම කළහ.

15. කෝලිත හා උපතිස්ස දෙදෙනාගේ මුල්ම ගුරුවරයා වූයේ, .................................. ය.

( සංජය පිරිවැජියා/අනේපිඬු/දුරුතු/උපක ආජීවකයා/වෙසක්)

➢ ගැලපෙන පිළිතුර තෝරා යා කරන්න

| | |
|---|---|
| 16. පූර්වාරාමය ඉදිකරවීම | A කේශ ධාතු. |
| 17.අසරණ සරණ ගුණය | B අනාථ පිණ්ඩික සිටුතුමා. |
| 18. ආනන්ද බෝධි රෝපණය | C දම්සක් පැවතුම් සූත්‍රය |
| 19. මහියංගන ස්ථූපය | D විශාඛා සිටු දේවිය |
| 20. බරණැස ඉසිපතනාරාමය | E සෝපාක |

(ලකුණු 2 x 20 = 40)

II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. දෙවෙනි ප්‍රශ්නයේ සිට සෑම ප්‍රශ්නයකම

(I) කොටසට ලකුණු 02 ක් ද,

(II) කොටසට ලකුණු 03 ක් ද,

(III) කොටසට ලකුණු 05 ක් ද හිමි වේ.

1. (I) සත්සතිය වඳින ගාථාවේ පළමු පද දෙක ලියන්න.
   (II) බුදුන් හා දහම් සරණ ගිය පළමු උපාසකවරු නම් කරන්න.
   (III) බුදුරජාණන් වහන්සේ ගිලානෝපස්ථානය ආදර්ශයෙන්ම පෙන්වා දුන් අවස්ථාවකට උදාහරණයක් ලියන්න.
   (IV) නව අරහාදී බුදුගුණ වලින් දෙකක් ලියන්න.
   (V) භාවනාවට සූදානම් වන්නකු වාඩි වන ඉරියව් දෙක නම් කරන්න.
   (VI) බුදු සසුනේ තෙරුවන් සරණ ගිය පළමු උපාසිකාවන් නම් කරන්න.
   (VII) බුදුරජාණන් වහන්සේ පළමු ධර්ම දේශනාව පැවැත්වූයේ කුමන පොහෝ දිනකදී ද?
   (VIII) උරුවෙල් දනව්වට වැඩම කළ බුදුරජාණන් වහන්සේට හමු වූ ජටිල සහෝදරයින් නම් කරන්න.
   (IX) බුදු සසුනේ අග්‍ර ශ්‍රාවක දෙනම නම් කරන්න.
   (X) බුදුරජාණන් වහන්සේ සත් සතියේ පළමු හා දෙවන සති ගත කළ ස්ථාන දෙක ලියා දක්වන්න.

(ලකුණු 2 x 10 = 20)

2. (I) සම්මා සම්බුද්ධත්වයට පත් බුදු හිමියන්ගෙන් ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස ආරාධනා කළේ කවුද ?
   (II) පස්වග මහණුන්ගෙන් තිදෙනෙකු නම් කරන්න.
   (III) බුද්ධ ශාසනයේ පළමු,දෙවන හා තෙවන ධර්ම දූත කණ්ඩායම් ලියා දක්වන්න.

3. (I) බුදුරජාණන් වහන්සේ අසරණයන්ට හා ගිලනුන්ට උපස්ථාන කළ අවස්ථා සඳහා උදාහරණ එක බැගින් ලියන්න.
   1.අසරණයන්ට පිහිට වීම
   2.ගිලනුන්ට පිහිට වීම
   (II) බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි උපස්ථායකයෙකු ළඟ තිබිය යුතු ගුණාංග වලින් තුනක් ලියන්න.

   (III) කුඩා කල සිටම අසරණ අයට පිහිට වීම ඔබ තුළද වර්ධනය කරගතයුතු ගුණාංගයකි. පාසල් ශිෂ්‍යයෙක් ලෙස අසරණයන්ට පිහිට විය හැකි ආකාර 05 ක් ලියන්න.

4. (I) බුදුගුණ අලංකාරය නමැති කෘතිය රචනා කළේ කවුරුන් විසින්ද?
   (II) රහසත් පව් නොකොට ........ යන කවිය සම්පූර්ණ කරන්න
   (III) උතුම් බුදු ගුණයන් මෙනෙහි කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රතිඵල 05 ක් ලියන්න.

5. (I) සිරිත් හා විරිත් යන්නෙහි අදහස කෙටියෙන් ලියන්න.
   (II) පාසලේදී ඔබට අනුගමනය කළ හැකි සිරිත් විරිත් 03 ක් ලියන්න.
   (III) දිනපතා පාසල තුළ ප්‍රදර්ශනය කිරීමට සුදුසු සිරිත් විරිත් ඇතුළත් ආදර්ශ පාඨ 05 ක් සකසන්න.

6. (I) පිරුවානා පොත් වහන්සේ තුළ ඇතුළත්ව ඇති තුන් සූත්‍රයෙන් සූත්‍ර දෙකක් ලියන්න.
   (II) භාවනාව සතර ඉරියව්වෙන් සිදු කළ හැකිය. ඉන් ඉරියව් 03 ක් ලියා දක්වන්න.
   (III) අන් අයට මෛත්‍රී කිරීමෙන් ඔබේ ජීවිතය සාර්ථක කර ගත හැකි ආකාරයන් 05 ක් ලියන්න.

7. (I) බුදු සසුනේ අග්‍ර දායකයා හා දායිකාව නම් කරන්න.

(II) ධනංජය සිටුතුමා යුගදිවියට පිවිසෙන තම දියණියට දුන් වටිනා උපදේශවලින් කරුණු 03 ක් ලියන්න.

(III) ඉහත ඔබ සඳහන් කළ එක් චරිතයක් මූලික කරගෙන,ඔබේ දිවිය සාර්ථක කර ගැනීමට ලබාගත හැකි ආදර්ශ 05 ක් ලියා දක්වන්න.